**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රිකය**
**---------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,055,442 ක පොලී ආදායම් ආදායම් හා වියදම් ගිණුමේ රු.1,001,275 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ පොලී ආදායම සහ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය රු.54,167 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වීථි පහන් භාරකරුවෙකුගේ හා පුස්තකාලාධිපතිවරියකගේ 2005 වර්ෂයේ සිට 2013 නොවැම්බර් දක්වා කාලයට අදාළ හිඟ වැටුප් ගෙවීම් සමාලෝචිත වර්ෂයට අදාළ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.294,886 ක් ගිණුම් වලවැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) අම්පිටිය නව නිර්මාණ සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියෙහි සුදුසුබව තීරණය කිරීම සඳහා සකස් කර තිබූ භූ විද්‍යා තාක්ෂණ වාර්තාව සඳහා ගෙවා තිබූ රු.235,862 ක මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වත්කම්වල අළුත්වැඩියාවන් හා නඩත්තු යටතේ පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉදිරි වර්ෂයට අදාළ රු.101,516 ක රක්ෂණ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන ජල පාරිභෝගිකයින්ගෙන් අයවිය යුතු රු.4,861,933 ක හිඟ ජල ගාස්තුව, ගෙවිය යුතු රු.14,431,712 ක ජල ආරක්ෂණ ඇප තැන්පතු මුදලින් හිලව් කර ඉතිරි රු.9,569,779 ක ශේෂය විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව ආදායමට එරෙහිව ලියා හැර තිබුණි.

(ඊ) 1982 - 2012 කාලයට අදාළ කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු රු.35,047,010 ක මුද්දර ගාස්තු වටිනාකම රු.35,295,887 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය රු. 248,877 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ රු. 176,859 ක වටිනා ස්ථාවර වත්කම්, ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 164,877 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් කැබලි කර විකිණීමේදී පොදු කටයුතු සඳහා සභාවට අයත් වූ ඉඩම් 05 කට අදාළව ලැබූ ඉඩම් කට්ටි, තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 08 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් අදාළ උපලේඛනවල එකතුව සමඟ සැසඳීමේදී රු.34,158,291ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 119,211,969 ක් වූ අතර, එයින් වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.16,199,330 ක් වී තිබුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට පැවති ණය හිමි ශේෂවල එකතුව රු. 95,070,860 ක් වූ අතර, එයින් වසරකට වැඩි කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.181,619 ක් බව නිරීක්ෂණය විය.

### 1.3.5 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ. 19 . XI වගන්තිය | අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව, ප්‍රාදේශීය සභාවේ ඉඩම් බදුදිය නොහැකි වුවත්, ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටස් 02 ක් රු.70,000 කට බදු දී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවත්, අවස්ථා 11 කදී ලබා දුන් රු.51,326 ක අත්තිකාරම් පියවීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතිණි. |
| (ඇ) (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ විධිමත් පරීක්ෂණයක්ද, සෑම වාහනයකම එහි ඉන්ධන දහන ප්‍රමාණය ඇගයීම සඳහා ප්‍රවීන ඉංජිනේරුවරයෙකු ලවා පරීක්ෂාවක්ද කළ යුතු වුවත්, සභාව සතු වාහනවල එවැනි පරීක්ෂණයක් කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,030,752 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,156,167 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.27,874,585 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** **ආදායම් පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එකතුව රු.161,245,118 ක හිඟ ආදායමක් නිරීක්ෂණය වූ අතර, එයින් 2015 ජූලි 31 දින වන විට රු.159,131,492 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

**2.3** **පරිසර බලපත්‍ර ගාස්තු**

පරිසර බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර 42 ක් සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය යටතේ නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය පරිදි බලපත්‍ර නිකුත් නොකිරීම නිසා සභාවට ලැබියයුතු රු. 294,000 ක ආදායම් අහිමි වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභාවේ නිලධාරීන් සඳහා රු.24,536,058 ක වැටුප් ගෙවා තිබූ අතර, ඉන් රු.5,244,190 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණය නොකර සභා අරමුදලින් දරා තිබුණි.

**(ආ)** 2014 වර්ෂයට අදාළව සිදු කර තිබූ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව අම්පිටිය සහ තැන්නේකුඹුර මහජන පුස්තකාලවල සමීක්ෂණ කටයුතු සඳහා ඉදිරිපත් නොකළ පිළිවෙළින් රු.79,359 ක වටිනාකමින් යුත් පොත් 462 ක් සහ රු. 25,490 ක වටිනාකමින් යුත් පොත් 138 ක ඌනතාවයන් පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණ සිදු කර නොතිබුණි.

**(ඇ)** 2009 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයෙන් සභාව වෙත ලබා දී ඇති කැබ් රථ දෙකක් 2015 ජුනි 30 දින වන විටත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 ඝන අපද්‍රව්‍ය කළමනාරකණය

---

ප්‍රාදේශීය සභාව කසල කළමනාරකණය සඳහා වර්ෂ ගණනාවක සිට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ කසල කළමනාකරණය සඳහා 2014 ජූනි මාසයේදී රු.1,000,000 ක මුදලක් ලබා දී ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.3 සේවක ණය

---

ප්‍රාදේශීය සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය වැඩ තහනමට ලක් වී තිබූ විශ්‍රාම ගන්වා තිබූ හා මිය ගිය සේවකයින් 31 දෙනෙකුගෙන් වසර 10 කටත් වඩා වැඩි කාල පරාසයක් තුළ අය නොවී පවතින රු. 599,712 ක සේවක ණය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 අවිධිමත් ගනුදෙනු

---

(අ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක එම්ඕඑෆ්පී දරන 01/2010/01මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 02(i) සහ 02(iv) හි විධිවිධාන ප්‍රකාර විදේශගත වීමට පෙර විධිමත් පරිදි විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගත යුතු විය. එසේ නොවූ විටදී විදේශගත වීම සඳහා ලබාදුන් දීමනා අයකරගත යුතුවිය. සභාපතිවරයා 2014 දෙසැම්බර් 06 දින සිට 14 වන දින දක්වා ජපානයේ පැවැත් වූ බෞද්ධ සමුළුවක් වෙනුවෙන් විදේශ චාරිකාවක නිරත වීම සඳහා පූර්ව නිවාඩු අනුමත කර ගෙන නොතිබුණු අතර, 2014 දෙසැම්බර් මාසයේ දී උණුසුම් ඇඳුම් දීමනා සහ අනියම් දීමනා ලෙස රු.75,532 ක් ද ගෙවා තිබුණි. චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව විගණන දිනය වූ 2015 ජූලි මස 17 වන දිනය දක්වාම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැනීමට හෝ අදාළ දීමනා ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයට පෙර සිට ප්‍රාදේශීය සභාවේ වියදම් ණයහිමියන් ලෙස දිගින් දිගටම පැවත එන රු. 6,215,726 ක ශේෂය අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2014 දෙසැම්බර් මස ගනු ලැබූ සභා තීරණයක් මත ගිණුම්වලින් කපාහැර තිබුණි**.**

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---

**ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන**

---

(අ) රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ (සංවර්ධන) 2015 අප්‍රේල් 24 දිනැති අංක PL/3/1/47 දරන ලිපිය මගින් 2014 වර්ෂය සඳහා අනුමත කර ඇති ව්‍යාපෘති 2014 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කළයුතු විය. එසේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ සියළු ව්‍යාපෘති එදිනට පසු අවලංගු වන බව දන්වා තිබුණි. එසේ තිබිය දී, එකී වැඩසටහන යටතේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් රු.3,000,000 ක මුදලක් සභාව වෙත ලබා දී තිබුණු අතර, 2014 වර්ෂය තුළ ඉන් එක් ව්‍යාපෘතියක් පමණක් අවසන් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.2,021,775 ක් ඉතිරි වී තිබූ හෙයින්, මෙම වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) 2014 මැයි 05 දිනැති අංක 01/2014 දරන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 05 වන වගන්තිය ප්‍රකාර සෑම මසකම ප්‍රගතිය ඊළඟ මාසයේ 05 වැනි දිනට ප්‍රථම පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කළයුතු වුවද, එම උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සභාව මගින් ජල සම්පත් හා ජලා ප්‍රවාහන මණ්ඩලය වෙත ජල සැපයුම් පවරා දී තිබියදී අනුමත කාර්ය මණ්ඩලයෙහි ජල කම්කරු, ජල මනු කියවන්නා සහ ජල නල වැද්දුම්කරු යන තනතුරු අවශ්‍ය නොවීය. ඒ පිළිබඳ සමාලෝචනය කර සහා අවශ්‍යතාය මත කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු. 20,284,560 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණු නමුත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 උප පරිච්ඡේදය ප්‍රකාරව, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අයවැය පාලනය

--------------------

**පහත කරුණු නිරීක්ෂණය ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් සහ වියදම් සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 15 සිට සියයට 81 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 7 සිට 100 දක්වාද විචලනයන් නිරීක්ෂණය වු බැවින් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ආදායම් සහ තථ්‍ය ආදායම් සැසඳීමේදී රු.11,597,641ක ඌන ආදායම් ඇස්තමේන්තු කර තිබුණි.

## 5. පද්ධති හා පාලනය

-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය